# වාර්ෂික වාර්තාව

# வருடாந்த அறிக்கை

# Annual Report

ත්‍රිපෝෂ
THRIPOSHA
திரிபோஷ
A SRI LANKA FORTIFIED FOOD PROGRAMME OF THE MINISTRY OF HEALTHCARE & NUTRITION





## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## இலங்கை திரிபோஷ கம்பனி
## Sri Lanka Thriposha Ltd

## 2021

# පටුන


පසුබිම ........ 01

ඉතිහාසය ........ 02

අපගේ දැක්ම ........ 03

අපගේ මෙහෙවර ........ 03

විස්තීර්ණ විශ්ලේෂණය ........ 04

වටිනාකම් සහ යොමුගත ක්ෂේත්‍ර ........ 05

ඉලක්ක ........ 06

සභාපතිතුමාගේ පණිවිඩය ........ 08

සංවිධාන ව්‍යුහය ........ 09

අධ්‍යක්ෂ මණ්ඩලය ........ 10

සමස්ථ නිෂ්පාදනය පිළිබද තොරතුරු ........ 12

ත්‍රිපෝෂ බෙදාහැරීමේ තොරතුරු ........ 14

සාරාංශගත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම කරුණු ........ 15

අවදානම් කළමනාකරණය ........ 16

ප්‍රධාන කාර්යසාධන දර්ශක ........ 19

තිරසාර සංවර්ධන ඉලක්ක ........ 20

උපායමාර්ග ........ 21

ඇමුණුම්

- ★ පාර්ශවකාර විශ්ලේෂණය ........ 23
- ★ 'ශදුඅත' විශ්ලේෂණය ........ 25
- ★ පෝටර්ගේ පංච මහා බලවේග ........ 26

ස්තුතිය ........ 27

විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ........ 28

විගණකාධිපති වාර්තාව ........ 59

# පසුබිම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ("SLTL" හෝ "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) ආයතනය, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ රාජ්‍ය ව්‍යවසායයක් ලෙස 2010 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද්දේ ය. “ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කිරීමේ” ප්‍රධාන අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා පිහිටුවන ලද මෙම ආයතනය ආරම්භයේ දී හඳුන්වා දෙන ලද්දේ “ත්‍රිපෝෂ වැඩසටහන” යනුවෙනි. ත්‍රිපෝෂ වැඩසටහන 1973 වසරේ දී ආරම්භ කරන ලද්දේ, ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි “කෙයා” (“CARE”) නමැති මානුෂීය සංවිධානයේ සහාය ඇතිව ය. ආරම්භයේ දී, මෙම අධි ආහාර අතිරේකය ඇමරිකා එක්සත් ජනපදයෙන් ආනයනය කර ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමට පෙර ශ්‍රී ලංකාවේ ඇසුරුම් කරන ලදී. ආරම්භක අවස්ථාවේ සිට මේ දක්වා ත්‍රිපෝෂවල ප්‍රධාන අමුද්‍රව්‍ය වනුයේ බඩඉරිඟු, සෝයා සහ කිරිපිටි යන නිෂ්පාදනයන් ය.

සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම වැඩසටහන උදෙසා සිය සහයෝගය 1976 වර්ෂයේ සිට ලබා දුන් අතර, එහි කළමනාකාරිත්වය පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් කැඳවුම් ක්‍රියාවලියක් හරහා ලංකා දුම්කොළ සමාගම (“CTC”) තෝරා ගන්නා ලදී. 2010 වසරේ දී මෙම වැඩසටහන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් (SLTL) නමින් පූර්ණ වශයෙන්ම රජයට අයත් සමාගමක් බවට පත් කර සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට භාර කරන ලදී. 2016 වසරේ දී එක්ස්ට්‍රෑඩර් යන්ත්‍ර (Extruder) ප්‍රතිස්ථාපනය කිරීමෙන් උත්පාදනය වූ අතිරික්ත නිපැයුම් ධාරිතාව හේතුවෙන්, වර්ෂ 2017 දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් “සුපෝෂ” ("Suposha") නමින් සන්නාමගත තම වාණිජ නිෂ්පාදනය වෙළඳපොළ වෙත දියත් කර හඳුන්වා දීමට ඊට හැකි විය. වසර 2020 දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයේ රේඛීය අමාත්‍යාංශය ලෙස එය, කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතට අනුයුක්ත කෙරිණි.

# ඉතිහාසය

**1973**

ත්‍රිපෝෂ වැඩසටහන, ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි “කෙයා” (“CARE”) නමැති මානුෂීය සංවිධානයේ සහාය ඇතිව ආරම්භ කෙරිණි. ආරම්භයේ දී, මෙම අධි ආහාර අතිරේකය ඇමරිකා එක්සත් ජනපදයෙන් ආනයනය කර “අයිසීඑස්එම්” (ICSM) පිටි යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ දී ඇසුරුම් කරන ලදී.

**1976**

මෙම වැඩසටහන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය හිමි විය. වැඩසටහනේ කළමනාකාරිත්වය “කෙයා” සංවිධානයේ විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා දෙන ලදී.

**1979**

ත්‍රිපෝෂ වැඩසටහන කළමනාකරණය කිරීම පිණිස සුදුසු සමාගමක් තෝරා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවන ලද අතර, අමාත්‍යාංශය, “කෙයා” සංවිධානය සහ ලංකා දුම්කොළ සමාගම අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ලංකා දුම්කොළ සමාගම වෙත ත්‍රිපෝෂ වැඩසටහනෙහි කළමනාකරණය ප්‍රදානය කරන ලදී.

**1980**

බ්‍රේඩි වර්ගයේ යන්ත්‍ර දෙකක් හඳුන්වා දෙමින් ජාඇල කර්මාන්ත ශාලාවේ ත්‍රිපෝෂ නිෂ්පාදනය ආරම්භ කෙරිණි. නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද වට්ටෝරුව වූයේ, ඉරිඟු-සෝයා මිශ්‍රණය (CSB) සහ ICSM පිටි සමන්විත සංයෝගයකි.

**1987**

“කෙයා” සංවිධානය ත්‍රිපෝෂ වැඩසටහනෙන් සම්පූර්ණයෙන්ම ඉවත් විය.

**2010**

ත්‍රිපෝෂ වැඩසටහන සමාගම් පනත යටතේ “ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්” (SLTL) ලෙස පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් බවට පත් කර, එම වැඩසටහන කළමනාකරණය කළ ලංකා දුම්කොළ සමාගම වෙතින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට එය පවරා ගනු ලැබිණි.

**2016**

බ්‍රේඩි එක්ස්ට්‍රෑඩර් ("Braidy" Extruder) යන්ත්‍රය වෙනුවට ඇන්ඩර්සන් ("Anderson") යන්ත්‍රයක් භාවිතා කරන ලද අතර එමඟින් ත්‍රිපෝෂ සඳහා වන සම්පූර්ණ ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට හැකි විය.

**2017**

නිෂ්පාදනයේ පැවති අතිරික්තය හේතුවෙන් "සුපෝෂ" නමින් වාණිජ නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වා දෙන ලද්දේ ය.

## අපගේ දැක්ම



නවොත්පාදනය තිරසාරභාවය හා කාර්යක්ෂමතාවය තුලින්

මන්දපෝෂණය තුරන් කිරිමෙහිලා

ජාතිය උදෙසා වූ විශ්වාසදායක පෝෂ්‍යගුණ

සපයන්නා බවට පත්වීම.

## අපගේ මෙහෙවර




ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත උපරිම පෝෂණගුණ සපිරි
ත්‍රිපෝෂ ආහාරය සපයාදීම මගින් ද ,
දේශීය ගොවියා වෙතින් අමුද්‍රව්‍ය මිලදී ගනිමින්
පෝෂණීය අතිරේක ආහාර නිෂ්පාදන
වෙළඳපොලට හඳුන්වා දීම මගින් ද
සෞඛ්‍ය සම්පන්න ජාතියක් උදෙසා දායක වීම
අපගේ අරමුණ වේ.

පළමුව, වටිනාකම් හඳුනා ගැනුනු අතර, දැක්ම සහ මෙහෙවර ඒවා තුළින් උකහා ගන්නා ලදී.

ඉලක්ක සහ උපාය මාර්ග පිහිටුවා ගනු ලැබ ඇත්තේ, පිළිවෙළින් පරතර විශ්ලේෂණය (සම්මුඛ සාකච්ඡාවලින් හඳුනා ගන්නා ලද) සහ පාරිසරික විශ්ලේෂණය මගින් එක්රැස් කර ගන්නා ලද අභ්‍යන්තර හා බාහිර යන සාධක ද්වයම සලකා බලමිනි.

වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍ර 5 කට පරතර වර්ග කරනු ලැබ තිබේ. මෙම පරතර සහ පාරිසරික විශ්ලේෂණ සැලකිල්ලට ගනිමින් කේන්ද්‍රීය යොමුගත ක්ෂේත්‍ර පිහිටුවා ගැනිණි. මෙම සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා පිළිවෙලින් ඉලක්ක, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී.



# වටිනාකම් සහ යොමුගත ක්ෂේත්‍ර

ස්වකීය දැක්ම සහ මෙහෙවර සපුරා ගැනීමට නම්, සමාගම විසින් තිරව බැඳී කටයුතු කරනු ලැබිය යුතු පහත දැක්වෙන වටිනාකම්, මූලධර්ම ලෙස හඳුනා ගැනිණි:

- මහජන අවධානය
- පෝෂණීය සාරගුණය
- තිරසාරත්වය
- අඛණ්ඩ වැඩිදියුණුව
- ඍජු අවංකභාවය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට සිය ඉලක්ක සහ උපාය මාර්ග පෙළගස්වා ගැනීම සඳහාත් අවසාන වශයෙන්, එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහාත් සහය වනු පිණිස අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හතරක් (4) හඳුනා ගන්නා ලදී.

### අපගේ කැපවීම

ස්වයංපෝෂිත වන අතරම රටේ මන්දපෝෂණය තුරන් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්

පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම.

### අපගේ මෙහෙයුම්

අනලස්ව ක්‍රියාත්මක වෙමින් පෝෂණීය ආහාර නිෂ්පාදනවල තිරසාර ප්‍රභවය සලසා ගැනීම, ඒවා සැකසීම, අලෙවි කිරීම සහ බෙදා හැරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

### අපගේ නිෂ්පාදනය

අවසාන පාරිභෝගිකයාට ලබා දෙන නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය කෙරෙහි අවධානය යොමු කිරීම.

### අපගේ ජනතාව

අපගේ වටිනාකම වත්කම වන සේවක සේවිකාවන් කෙරෙහි අවධානය යොමු කිරීම.

# ඉලක්ක

ඉලක්ක නිමවා පිහිටුවා ගෙන ඇත්තේ, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් සිය අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර තුළ සාර්ථක වීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳ දිශානතියක් සැපයීම සඳහා ය. මෙමගින්, සමාගමේ උපාය මාර්ග සහ ක්‍රියාකාරි සැලසුම් පිළිබඳව දැනුම් දීමක් කෙරෙනු ඇත.





අපගේ කැපවීම

| අංකය | ඉලක්කය | විස්තරය |
|---|---|---|
| ඉලක්ක 1 | අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම | සමාජයට සමාගමේ දායකත්වය වැඩි දියුණු කරමින් ලබා දීමට කටයුතු කිරීම. |



අපගේ මෙහෙයුම්

| අංකය | ඉලක්කය | විස්තරය |
|---|---|---|
| ඉලක්ක 2 | යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීම. | නිෂ්පාදන කම්හල, ගබඩා කිරීම, සැපයුම් සහ තාක්ෂණය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම, පිරිවැය අවම කිරීම සහ පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම සඳහා නව විසඳුම් සොයා ගැනීම. |
| ඉලක්ක 3 | ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම. | ජාතිය උදෙසා මනා පෝෂණයක් ලබාදීම සඳහා ඵලදායී මෙහෙයුම් කළමනාකරණයක් තුළින් තිරසර ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීම. |

# ඉලක්ක

අපගේ නිෂ්පාදනය

| අංකය | ඉලක්කය | විස්තරය |
| --- | --- | --- |
| ඉලක්ක 4 | පර්යේෂණය සහ නවෝත්පාදනය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය අත් කර ගැනීම. | නවෝත්පාදනය සහ තාක්ෂණික සංවර්ධනය තුළින් නිවැරදි නිෂ්පාදන සැපයීම. |

අපගේ ජනතාව

| අංකය | ඉලක්කය | විස්තරය |
| --- | --- | --- |
| ඉලක්ක 5 | ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම. | සේවකයින් සහ ඔවුන්ගේ සේවායෝජකයා තම සහ සමාගමේ සංවර්ධනය විවෘතව හඳුනාගෙන අගය කරන ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීම මගින් සේවක උන්නතිය සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම. |

# සභාපතිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ පූර්ණ රජය සතු සමාගමක් ලෙස 2011 වර්ෂයේදි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සංස්ථාගත කිරීමේදි සංස්ථාවලියේ දක්වා ඇති අරමුණුවලින් ප්‍රධානතම අරමුණ පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනි මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම සිදු වු අතර 2020 වසරේ මා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ වැඩ භාරගත් දින සිට මේ දක්වාද එම ඉලක්කය සැපිරීමට හැකි විය.

ශ්‍රී ලංකාව ඇතුළු මුළු ලෝකයම වෙලාගත් කොරෝනා වසංගත තත්වය හමුවේ වුවද ඉතා සීමිත සම්පත් ප්‍රමානයක් පමනක් භාවිතා කරමින් 2021 වර්ෂයේදි ත්‍රිපෝෂ හා සුපෝෂ මෙ.ටො. 8,458 නිෂ්පාදනය කිරිමට හැකි වු අතර රුපියල් මිලියන 129ක සමස්ථ බදු පෙර ලාභයක් ඉපයිමට හැකි විය.

මේ සදහා අපහට සහයෝගය දැක්වු අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමා, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්විමෙන් පසු එම අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා, ලේකම් ගරු කේ. එම්. එස්. ඩි. ජයසේකර මැතිතුමිය, සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා සහ ලේකම් මේජර් ජනරාල් සංජිව මුණසිංහ මැතිතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු එස්. ආර්. ආටිගල මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

දිප්ති කුලරත්න
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම




- Acc.Offi - ගිණුම් නිලධාරි
- AO - පරිපාලන නිලධාරි
- Dist - බෙදාහැරීමේ නිලධාරි
- FO - මූල්‍ය නිලධාරි
- IA - අභ්‍යන්තර විගණක
- Mgt Assis - කළමනාකරණ සහකාර
- Pur - මිලදී ගැනීමේ නිලධාරි
- Prod - නිෂ්පාදන නිලධාරි
- WH - ගුදම් ගබඩා නිලධාරි

# අධ්‍යක්ෂ මණ්ඩලය







සභාපති
දිප්ති කුලරත්න මහතා

වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මහත්මිය
මාතෘ හා ළමා කාර්යාංශය
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය



ආර්. එම්. පී. එස්. අබේරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ
(භාණ්ඩාගාර නියෝජිත)
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති
සංවර්ධන අමාත්‍යාංශය

තේජා හේරත් මහත්මිය
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
කාර්මික තාක්ෂණික ආයතනය

නීතිඥ ප්‍රනීත් මාහල්ල මහතා
නීති උපදේශක
කාර්මික තාක්ෂණ ආයතනය

# අධ්‍යක්ෂ මණ්ඩලය



ලක්මිනි එන් මාගොඩරත්න මහත්මිය
පෝශණ සම්බන්ධීකරණ අංශය
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය



ඒ පි කොඩිකාර මහත්මිය
ප්‍රධාන මුල්‍ය නිළධාරි
කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය,
පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන,
පාසල් යටිතල පහසුකම් සහා
අධ්‍යාපන සේවා



ඩී සී වික්‍රමසිංහ මහත්මිය
ප්‍රධාන මුල්‍ය නිළධාරි
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය



තනුජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

| වර්ෂය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| (මෙ ටොන්) | 13,446 | 14,520 | 15,429 | 7,927 | 8,458 |

2017 සිට 2021 වසර දක්වා නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින්



## 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ත්‍රිපෝෂ නිෂ්පාදනය (මාස්ටර් බෑග්)

| මාසය | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 56,236 | 51,069 | 43,003 | 46,805 | 3,334 |
| පෙබරවාරි | 48,288 | 40,351 | 35,715 | 30,492 | 35,408 |
| මාර්තු | 58,150 | 47,969 | 47,125 | 30,118 | 62,410 |
| අප්‍රේල් | 46,956 | 25,720 | 28,954 | 30,583 | 7,541 |
| මැයි | 49,432 | 55,122 | 38,109 | 30,745 | - |
| ජුනි | 40,134 | 50,268 | 43,372 | 21,959 | 20,327 |
| ජුලි | 48,128 | 49,042 | 38,534 | 16,995 | 33,931 |
| අගෝස්තු | 53,179 | 40,374 | 52,835 | 4,850 | 15,232 |
| සැප්තැම්බර් | 36,295 | 48,670 | 47,082 | 13,147 | 32,500 |
| ඔක්තෝම්බර් | 27,311 | 50,036 | 71,004 | 11,877 | 20,975 |
| නොවැම්බර් | 49,829 | 47,152 | 57,490 | 16,645 | 15,792 |
| දෙසැම්බර් | 30,017 | 23,703 | 17,329 | 11,910 | - |
| **මාස්ටර් බෑග්** | **543,955** | **529,476** | **520,552** | **266,126** | **247,450** |
| **මෙ. ටොන්** | **12,239** | **11,913** | **11,712** | **5,988** | **5,568** |

★ ත්‍රිපෝෂ මාස්ටර් බෑග් එකක 750g ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු වේ.

# ත්‍රිපෝෂ බෙදාහැරීමේ තොරතුරු

| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | මාසික ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2021 | 2021 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ මාස්ටර් බෑග් ප්‍රමාණය |
|---|---:|---:|
| අම්පාර | 14,958 | 4,985 |
| අනුරාධපුරය | 43,940 | 11,704 |
| බදුල්ල | 39,504 | 9,605 |
| මඩකලපුව | 23,957 | 7,987 |
| කොළඹ | 61,921 | 24,727 |
| ගාල්ල | 34,727 | 9,272 |
| ගම්පහ | 69,107 | 12,069 |
| හම්බන්තොට | 29,459 | 7,794 |
| යාපනය | 18,995 | 5,506 |
| කල්මුනේ | 23,513 | 6,272 |
| කළුතර | 31,249 | 11,937 |
| මහනුවර | 60,058 | 17,752 |
| කෑගල්ල | 30,761 | 9,285 |
| කිලිනොච්චිය | 4,977 | 1,993 |
| කුරුණෑගල | 66,028 | 19,155 |
| මන්නාරම | 4,590 | 1,532 |
| මාතලේ | 20,692 | 5,325 |
| මාතර | 42,403 | 11,242 |
| මොනරාගල | 26,540 | 7,078 |
| මුලතිව් | 4,656 | 1,555 |
| නුවරඑළිය | 56,169 | 8,146 |
| පොළොන්නරුව | 21,023 | 7,010 |
| පුත්තලම | 29,910 | 9,210 |
| රත්නපුර | 51,953 | 14,002 |
| ත්‍රිකුණාමලය | 19,093 | 5,080 |
| වවුනියාව | 7,205 | 2,405 |
| ළය රෝහල | 1,550 | 416 |
| ජාතික සෞඛ්‍ය විද්‍යායතනය | 13,251 | 4,415 |
| රිජ්වේ ආර්යා ළමා රෝහල | 105 | 42 |
| **එකතුව** | **852,288** | **237,501** |

## විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් හා සහභාගි වු අනෙකුත් නිළධාරින්

| | | |
|---|---|---|
| i. R. M. P.S. අබේරත්න මයා | - | සභාපති, විගණන හා කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |
| ii. වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මිය | - | සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |
| iii. ආචාර්ය තේජා හේරත් මිය | - | සාමාජික, විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |
| iv. M. D. ජීවනි පුෂ්පලතා මිය | - | නිරීක්ෂක, විගණන හා කළමනාකරණ කමිටුව, විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය |
| v. තනුජා ප්‍රියදර්ශනි අල්විස් මිය | - | ජ්‍යේෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |
| vi. ඩී. බී. තරිදු චාමික මයා | - | මූල්‍ය කළමනාකරු, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |
| vii. එල්. ජේ. සරත් ප්‍රේමචන්ද්‍ර මයා | - | කැඳවුම්කරු, විගණන හා කළමනාකරණ කමිටුව අභ්‍යන්තර විගණක, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම |

## 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පහත දින වලදී පවත්වන ලදී

| | | |
|---|---|---|
| 01 | ප්‍රථම රැස්වීම | 2021 මාර්තු මස 02 දින |
| 02 | දෙවන රැස්වීම | 2021 ඔක්තෝබර් මස 25 දින |
| 03 | තෙවන රැස්වීම | 2021 දෙසැම්බර් මස 16 දින |

## සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු

01 2017 සිට 2020 දක්වා ගෙවීමට තිබූ හිඟ ආදායම් බදු මුදල් 2021 වර්ෂයේ ගෙවීම

02 වියදම් අනුමත කිරීමට ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් සඳහා ලබාදී තිබූ මූල්‍ය සීමාව රු. 50,000 සිට රු.100,000 දක්වා වැඩි කිරීම

03 2019 වර්ෂයේ ස්ථාවර වත්කම් වල ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රතිස්ථාපනය කිරීම

04 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ සඳහන් විශේෂ කරුණු

ආහාර නිෂ්පාදන අංශය ආශ්‍රිතව භාරදූර සබඳතාවක් ඇති ආයතනයක් ලෙස, වටිනාකමක් නිර්මාණය කිරීමේ ස්වකීය හැකියාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බාහිර හා අභ්‍යන්තර අවදානම් පරාසයකට නියත වශයෙන්ම සමාගම නිරාවරණය වේ. සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ව්‍යාපාරය හා සම්බන්ධ අවදානම් අවම කිරීම සහ කොටස් හිමියන්ගේ වටිනාකම් උත්පාදනය උපරිම කිරීම අතර ප්‍රශස්ත සමතුලිතතාවයක් ඇති කරයි. අවදානම් කළමනාකරණය යනු, ආයතනිකව ව්‍යාප්ත විනයක් ද වන අතර, පැහැදිලිව නිර්වචනය කරන ලද පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු සහ ක්‍රියා පටිපාටි මගින් අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ ඒවා දුර්මුඛ කිරීම සඳහා ස්ථාවර ආකාරයකින් ක්‍රියාත්මක වේ.

## අවදානම් පාලනය

සමාගමේ අවදානම් පැතිකඩ ඵලදායි ලෙස කළමනාකරණය කිරීමේ මුදුන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය උසුලයි. මූල්‍ය අවදානම් විෂයයෙහි මෙන්ම තෝරාගත් සේවක, සේවාදායක සහ පාරිසරික යන අංශ ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම යන කාර්යයේ දී ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන විගණන කමිටුව, එහි අවදානම හා බැඳි අධීක්ෂණ රාජකාරි සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. මූල්‍ය නොවන අවදානම් ප්‍රධාන වශයෙන් ව්‍යාපාරික ඒකක මට්ටමින් / ක්‍රියාකාරී මට්ටමින් පැන නගින අතර, ආයතනය පුරා ඇති අවදානම් ක්‍රියාශීලීව හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා සේවකයින් වගකිව යුතු ය.



**අවදානම් කළමනාකරණය විෂයයෙහි ප්‍රතිපත්ති සහ ඒ වෙත ප්‍රවේශය**

සමාගම, ස්වකීය අවදානම් කළමනාකරණය කිරීමේ සහ මැනීමේ කාර්යයේ දී, ගෝලීය වශයෙන් පිළිගත් ආරක්ෂක මාදිලි තුනක් අනුගමනය කරයි. එමගින් අවදානම් කළමනාකරණයේ ද, අවදානම හඳුනා ගැනීමේ ද, අවදානම තක්සේරු කිරීමේ ද, අවදානම දුර්මුඛ කිරීමේ ද, අවදානම වාර්තා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ද කර්තව්‍යයන් පැහැදිලිව වෙන් කර තැබීම සහතික කරයි.




| | | |
|---|---|---|
| ➢ අවදානම් හඳුනාගැනීම | : | මුළු මහත් සේවක සහභාගිත්වය සහිතව, සියලු ව්‍යාපාරික ඒකක සහ කාර්යයන් හරහා අවදානම ක්‍රියාශීලීව හඳුනා ගැනීම සබැඳේ. |
| ➢ අවදානම් තක්සේරුව | : | විභව සම්භාවිතාව සහ බලපෑමේ විශාලත්වය මත පදනම්ව අවදානම් තක්සේරු කිරීම. |
| ➢ අවදානම දුර්මුඛ කිරීම | : | අවදානම ඵලදායී ලෙස දුර්මුඛ කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. |
| ➢ අවදානම් අධීක්ෂණය / වාර්තාකරණය | : | ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව වාර්තා කිරීම සහ අඛණ්ඩ පදනමක් මත ප්‍රධාන නිරාවරණ අධීක්ෂණය කිරීම. |

## අවදානම් රුචිකතාව සහ උපධාරණය

අවදානම් රුචිකතාව සහ උපධාරණය මගින් ව්‍යාපාර සැලසුම් කිරීම, සම්පත් වෙන්කර දීම සහ මෙහෙයුම් කළමනාකරණය සමඟ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කරන හෙයින් අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි එය අත්‍යවශ්‍ය වේ, සමාගම, ස්වකීය අරමුණු සහ ඉලක්ක කරා හඹා යාමේ දී සමූහය විසින් පිළිගනු ලැබීමට කැමති අවදානම් සීමාවේ මුවදොර, අවදානමේ උපධාරණ මට්ටම මගින් නිරූපණය කර දක්වයි.

| අඩු අවදානම | මැදි අවදානම | අධි අවදානම |
|---|---|---|
| **අවදානම් ප්‍රතිකර්මය : පිළිගත හැකි**<br><br>දෛනික ක්‍රියා පටිපාටි හරහා කළමනාකරණය කෙරෙන අතර නිශ්චිත සම්පත් අවශ්‍ය වීමේ ඉඩක් නොමැත.<br><br>**අවදානම් ප්‍රතිචාරය** | **අවදානම් ප්‍රතිකර්මය : පිළිගැනීම හා අධීක්ෂණය කිරීම**<br><br>ප්‍රතිකර්ම සැලැස්මෙහෙයුම් කළමණාකරුවන් විසින් සංවර්ධනය කර අධීක්ෂණය කිරීමට නියමිත ය.<br><br>**අවදානම් ප්‍රතිචාරය**<br><br>නිශ්චිත අධීක්ෂණ / ප්‍රතිචාර ක්‍රියා පටිපාටි හරහා කළමනාකරණය කෙරේ. | **අවදානම් ප්‍රතිකර්මය : අවදානම් ප්‍රතිචාරය වළක්වා ගැනීම**<br><br>ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවධානය අවශ්‍ය වේ. එමෙන්ම, කළමනාකරණ වගකීම නිශ්චිතව දක්වා තිබිය යුතු ය. |

KPI යනු, ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් කෙටියෙන් නම් කෙරෙන ආකාරයයි. එය, නිශ්චිත ඉලක්කයක් හෝ අරමුණක් කරා දිවෙන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා භාවිතා කරනු ලබන, මැනිය හැකි සහ ප්‍රමාණ කළ හැකි මිතිකයකි. මෙම KPI දර්ශක, ආයතනවලට තම ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීමටත්, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට සහ කාර්ය සාධනය ප්‍රශස්ත කර ගැනීමටත් උපකාර වේ.

මෙම ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් ඒ ඒ වැඩ කණ්ඩායම්වලට යොමු වීම සඳහා අවශ්‍ය ඉලක්කත්, ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය සන්ධිස්ථාන සහ මුළු මහත් ආයතනය ආවරණය වන පරිදි තීරණ ගැනීමේ දී නිසි මග පෙන්වීමට උපකාර වන තීක්ෂණ නිරීක්ෂණයත් සපයා දෙයි. ප්‍රධාන කාර්ය සාධන දර්ශක අධීක්ෂණය කිරීමෙන්, ආයතනවලට තම ශක්තීන් සහ දුර්වලතා ඇති ප්‍රදේශ හඳුනා ගැනීමටත්, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට සහ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම පිණිස ක්‍රියාමාර්ග ගැනීමටත් හැකි ය.

| දර්ශක | වර්ෂ | | |
|---|---|---|---|
| | **2019** | **2020** | **2021** |
| නිෂ්පාදන සැලැස්ම සාක්ෂාත් කර ගැනීම (සම්පූර්ණ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් වලින්) | 15,429 | 7,927 | 8,171 |
| විකුණුම් වර්ධනය = (ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම් - පෙර කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම්) / පෙර කාල පරිච්ඡේදයේ ශුද්ධ විකුණුම් | 16.77% | (39.64%) | 2.81% |
| දළ ලාභ ආන්තිකය = (ආදායම - විකුණූ භාණ්ඩවල පිරිවැය) / ආදායම | 7.91% | 8.81% | 10.86% |
| බද්දට පෙර ශුද්ධ ලාභ ආන්තිකය = (මුළු ආදායම - ආදායම් බදු රහිත මුළු වියදම්) / මුළු ආදායම | 5.46% | 5.09% | 6.36% |
| කාරක ප්‍රාග්ධනය = ජංගම වත්කම් - ප්‍රවර්තන බැරකම් (රු.මි.) | 668.71 | 645.25 | 786.29 |

සටහන : ගුණාත්මක අමුද්‍රව්‍ය සැපයුමේ ඌණතාවය, (විශේෂයෙන් බඩ ඉරිඟු) නොමැතිකම හේතුවෙන් සමාගම 2020 වර්ෂයේ ආරම්භයේ සිට නිෂ්පාදන ක්‍රියාවලියේ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේ ය.

නිශ්චිත ඉලක්කවලට අදාළ අනෙකුත් ප්‍රමාණාත්මක මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රධාන කාර්ය සාධන දර්ශක සමාගමේ ආයතනික සැලැස්ම තුළ සවිස්තරාත්මකව දක්වා ඇත.

# තිරසාර සංවර්ධන ඉලක්ක

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම හා සම්බන්ධ ප්‍රධාන තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වනුයේ :

**SDG 2**

කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

**SDG 9**

ඔරොත්තු දී පවතින යටිතල පහසුකම් ගොඩනැගීම, ඇතුළාන්තීය සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන පෝෂණය කිරීම

**SDG 12**

තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සහතික කිරීම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ ඉලක්ක, තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන බවට සහතික කිරීම සඳහා, යෝජිත ඉලක්ක සමඟ තිරසාර සංවර්ධන ඉලක්ක සැලසුම් ගත කරන ලදී.

| යොමුගත ක්ෂේත්‍රය | ඉලක්ක | තිරසර සංවර්ධන ඉලක්කය |
|---|---|---|
| අපේ කැපවීම | අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීම | 2 |
| අපේ මෙහෙයුම් | යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීම | 9, 12 |
| | ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීම | |
| අපේ නිෂ්පාදනය | පර්යේෂණය සහ නවෝත්පාදය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය ළඟා කර ගැනීම | - |
| අපේ මිනිසුන් | ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම | - |

සමාගමේ දැක්ම සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ මග පෙන්වීමක් ලබා දීම මගින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් උපකාර වන උපාය මාර්ග ඊළඟට නිර්මාණය කර ගන්නා ලදී.

|  | **1 වන ඉලක්කය \| අපගේ පාර්ශවකරුවන්ගේ සමාජ සුබසාධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ග** |
|---|---|
| **1.1** | සුභසාධන නිෂ්පාදය අඛණ්ඩව සැපයීම සහතික කිරීම |
| **1.2** | ප්‍රජා සංවර්ධනයට සහාය වීම |

|  | **2 වන ඉලක්කය \| යටිතල පහසුකම් සහ තාක්ෂණික දියුණුව පවත්වා ගැනීමේ උපායමාර්ග** |
|---|---|
| **2.1** | ගබඩා ධාරිතාව සහ අනෙකුත් අදාළ පහසුකම් වැඩි දියුණු කිරීම |
| **2.2** | විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පවතින නිෂ්පාදන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| **2.3** | කර්මාන්තශාලාව තුළ ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |
| **2.4** | තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම |

|  | **3 වන ඉලක්කය \| ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ උපායමාර්ග** |
|---|---|
| **3.1** | අභ්‍යන්තර ව්‍යාපාර ක්‍රියාවලි විධිමත් කිරීම |
| **3.2** | වෙළඳපළ ප්‍රවේශනය සහ නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම |
| **3.3** | ධනාත්මක වැඩ පරිසරයක් සහතික කිරීම සඳහා තත්ත්ව සහ ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වීම |
| **3.4** | නිෂ්පාදන සඳහා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීම |
| **3.5** | රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ අනුකූල වීම සහතික කිරීම |

| | |
|---|---|
| | **4 වන ඉලක්කය \| පර්යේෂණය සහ නවෝත්පාදය තුළින් නිෂ්පාදන විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ උපායමාර්ග** |
| **4.1** | නිෂ්පාදන සංවර්ධනය සහ තත්ත්ව පරීක්ෂාව සඳහා පහසුකම් සැලසීම පිණිස සම්පත් වැඩි දියුණු කිරීම |
| **4.2** | සමාගම විසින් පිරිනමනු ලබන නිෂ්පාදන ඒවාට අදාළ ඉලක්ක වෙළඳපොළට හඳුන්වා දීම සහ වැඩි දියුණු කිරීම |

| | |
|---|---|
| | **5 වන ඉලක්කය \| ආයතනික ඉගෙනීම සහ ධනාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීමේ උපායමාර්ග** |
| **5.1** | බඳවා ගැනීම් සහ අනුක්‍රමික සැලසුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම |
| **5.2** | ඵලදායී පුහුණු වැඩසටහන් හරහා පුද්ගල සංවර්ධනය දිරිමත් කිරීම |
| **5.3** | පරිපූර්ණ කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම |

## පාර්ශවකාර විශ්ලේෂණය

**පාර්ශවකාර විශ්ලේෂණය යනු, ස්වකීය බලය සහ උනන්දුව අනුව අදාළ පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහා වූ ක්‍රමානුකූල ක්‍රමයකි. අධි බලැති හා අධි උද්යෝගී පාර්ශවකරුවන් ප්‍රධාන ක්‍රීඩකයින් බවට පත් වේ. අඩු බලය සහ අඩු උනන්දුව වැදගත් වන්නේ අවම වශයෙනි.**




ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සම්බන්ධයෙන් ඉහළම බලය සහ උනන්දුව ඇත්තේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට, මහ භාණ්ඩාගාරයට, සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට ය. මෙම වෘත්තපාදයේ සිටින සෙසු අය ද ඇතුළුව මෙම පාර්ශවකරුවන් සමීපව නිරීක්ෂණය කළ යුතු ය.

- අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ද, ශ්‍රී ලංකා දුම්රිය, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම යන ආයතන ද ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විෂයයෙහි ඉහළ බලයක් දක්වන සහ සාපේක්ෂ වශයෙන් අඩු උනන්දුවක් ඇති පාර්ශවකරුවන් වේ. මෙම පාර්ශවකරුවන්ට ඉහළ බලයක් ඇති බැවින්, ඔවුන්ගේ උනන්දුව එතරම් ඉහළ මට්ටමක නොතිබුණ ද, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම ඔවුන් තෘප්තිමත් වන ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, ප්‍රතිලාභීන්, තරගකරුවන්, ගොවීන් යනු, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි ක්‍රියාකාරකම් කෙරෙහි අඩු බලයක් සහ ඉහළ උනන්දුවක් ඇති ඇතැම් පාර්ශවකරුවන් වන හෙයින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් තම ක්‍රියාකාරකම් පිළිබඳව මෙම පාර්ශවකරුවන් ද දැනුවත් කළ යුතු ය.

| පාර්ශවකරුවන් පිළිබඳ කෙටි යෙදුම් ලැයිස්තුව | |
| --- | --- |
| AG | විගණකාධිපති |
| BOC | ලංකා බැංකුව |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CPC | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව |
| DMS | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| GMOA | රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය |
| GoSL | ශ්‍රී ලංකා රජය |
| GT | සාමාන්‍ය වෙළඳාම |
| IRD | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| MoA | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| MoF | මුදල් අමාත්‍යාංශය |
| MOH | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| MOMCH | මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| MT | නවීන වෙළඳාම |
| PED | රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව |
| RDHS | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| SLR | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| SLSI | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ පරිසරය තවදුරටත් අවබෝධ කර ගැනීම සඳහා, ‘ස්වොට්’ (SWOT) හෙවත් ‘ශදුඅත’ විශ්ලේෂණයක් සිදු කරන ලදී. මෙය, එහි අභ්‍යන්තර ශක්තීන් සහ දුර්වලතා මෙන්ම එහි බාහිර අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සඳහා ද කරන ලද අධ්‍යයනයකි.

## ශක්තීන්

- ශක්තිමත් සන්නාම ප්‍රතිරූපය
- කර්මාන්තයේ පළපුරුද්ද සහ ප්‍රවීණත්වය
- රාජ්‍ය හිමිකාරිත්වය සහ අනුග්‍රහය
- රැකියා අවස්ථා උත්පාදකය
- දේශීය ගොවියා සවිබල ගැන්වීම
- බැංකු ණය ගැනීම් නොමැති වීම
- ආයතනික පාලනය
- රැකියා සුරක්ෂිතභාවය සහ සේවක තෘප්තිය
- වැඩි නිෂ්පාදන ධාරිතාව
- වෙනත් රාජ්‍ය ආයතනවලින් කෙරෙන සහය සේවා
- ස්වයං තිරසාර බව
- වාණිජ සන්නාම සඳහා වූ ප්‍රාථමික සන්නාමය තුළින් ශක්තිමත් වෙළඳ සන්නාමය ගොඩනැගීම
- රැකියා සුරක්ෂිතභාවය සහ තෘප්තිය මත රැකියා

## දුර්වලතා

- ත්‍රිපෝෂ බෙදාහැරීමේ අකාර්යක්ෂමතා
- පර්යේෂණ හා සංවර්ධන පහසුකම් නොමැතිකම
- ගබඩා ඉඩ ප්‍රමාණවත් නොවීම
- නිෂ්පාදන නවතා දැමීම් සඳහා උපස්ථ සැලැස්මක් නොමැතිකම
- නිෂ්පාදන නවතා දැමීම්
- නිෂ්පාදන අකාර්යක්ෂමතා
- ඒකාබද්ධ පද්ධති විසඳුමක් නොමැතිකම
- පුළුල් කිරීමේ අරමුදල් නොමැතිකම
- තත්ව ප්‍රමිති සඳහා ප්‍රතීතනය නොමැති වීම
- මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටලු
- සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ ප්‍රධාන කාර්ය දර්ශක නොමැතිකම
- ආරක්ෂිත තොග ගොඩනගා තබා ගැනීමක් නොමැති වීම
- ආයතනයේ දැක්ම පිළිබඳ ප්‍රකාශය වෙනස් කිරීම
- සෘජු අපනයන නොමැතිකම
- සන්නාම පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම
- විස්තාරණය සඳහා අරමුදල් නොමැතිකම

SWOT

## තර්ජන

- සැපයුම්කරුවන් සීමිත වීම
- රජයේ ප්‍රතිපත්ති වෙනස්වීම්
- සැපයුම්කරුවන් අනුකූලතාව නොදැක්වීම
- අනපේක්ෂිත දේශගුණික විපර්යාස
- සෘජු හා වක්‍ර ආදේශක නිෂ්පාදනවලින් එල්ල වන දැඩි තරගය
- තරගකාරී නිෂ්පාදන සමඟ මිල වෙනස
- තරගකරුවන්ගේ වැඩි දෘශ්‍යතාව සහ අලෙවි ප්‍රයත්න
- වහා ආහාරය පිණිස සූදානම් ධාන්‍ය නිෂ්පාදනවලින් එල්ලවන තර්ජනය
- තරගකරුවන් සතු විවිධාංගීකරණය වූ නිෂ්පාදන කළඹ

## අවස්ථා

- විභව යටිතල පහසුකම් සංවර්ධනය
- තත්ව ප්‍රමිති සඳහා ප්‍රතීතනය ලබා ගැනීම
- ඒකාබද්ධ පද්ධති විසඳුම
- ස්වයංක්‍රීය කිරීමේ හැකියාව
- නව නිෂ්පාදන සංවර්ධනය
- පිටි සඳහා ආදේශකයක් ලෙස "සුපෝෂ" අලෙවි කිරීම
- වෙළෙඳපොළ පුළුල් කිරීමේ හැකියාව
- නිෂ්පාදන කළඹ ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත නොමිලයේ නිකුත් කරනු ලබන “ත්‍රිපෝෂ” නමින් හැඳින්වෙන සුබසාධන නිෂ්පාදනයක් සහ මූලික වශයෙන් අලෙවි නියෝජිත ජාලයක් හරහා සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කෙරෙන “සුපෝෂ” නම් ප්‍රතිසන්නාමගත වාණිජ නිපැයුමක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම නිෂ්පාදනය කරයි. එබැවින්, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙහි ලාභ ලබන ව්‍යාපාරික අංශය එම සන්නාමය වන හෙයින්, මෙම විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ “සුපෝෂ” නිපැයුම වෙත අවධානය යොමු කරමිනි.

අධි

## ආදේශකවල තර්ජනය

- ධාන්‍ය පදනම් කරගත් පුළුල් පරාසයක නිෂ්පාදන වෙළඳපොළෙහි තිබීම
- තරගකරුවන්ට සාපේක්ෂව තනි නිෂ්පාදනයක් පමණක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් නිෂ්පාදනය කිරීම
- උදෑසන ආහාරය සඳහා බොහෝ විකල්ප නිෂ්පාදන තිබීම
- වෙළඳපොළෙහි අඩු වියදම් විකල්ප නිෂ්පාදන තිබීම
- බත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය වීම

අවම

## නව ප්‍රවේශකවල තර්ජනය

- කතිපයාධිකාරය
- අධි ප්‍රාග්ධන අවශ්‍යතා
- පරිමාණිය ආර්ථිකයන්
- සේවාදායක සන්නාම පක්ෂපාතිත්වය
- තරගකරු ප්‍රබල ස්ථානයක් පවත්වා ගැනීම
- නිශ්චිත රාජ්‍ය නීති රෙගුලාසි නොමැති වීම




අධි

## සැපයුම්කරුගේ බලය

- බඩ ඉරිඟු සහ සෝයා සඳහා ආදේශක නොමැති වීම
- කෘෂි නිෂ්පාදන ප්‍රධාන අමු ද්‍රව්‍ය වීම
- අනපේක්ෂිත කාලගුණික රටා සැපයුම කෙරෙහි බලපෑම
- කිරි පිටි සඳහා එකම සැපයුම්කරු, මෙහෙයුම් වෙනුවෙන් භාවිතා කරන තෙල් සඳහා එකම සැපයුම්කරු
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා විශේෂිත අමතර කොටස් අවශ්‍ය වීම

මධ්‍යස්ථ

## ගැනුම්කරුගේ බලය

- ත්‍රිපෝෂ සඳහා ගැනුම්කරු බලයක් නොමැති වීම
- කතිපයාධිකාරය නිසා ප්‍රභේදනය නොවූ නිෂ්පාදනවල පිරිවැය අඩුවෙන් මාරු වීම
- නවීන වෙළඳ ගනුදෙනුකරුවන් බලවත් වීම

# ස්තුතිය...

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපණ, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් එම අමාත්‍යාංශ වල ලේකම්වරු වන ගරු මේජර් ජනරාල් සංජීව මුණසිංහ මැතිතුමා, ගරු කේ. එම්. එස්. ඩී. ජයසේකර මැතිතුමියට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු එස්. ආර්. ආටිගල මැතිතුමාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරීත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධූරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනිමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.



## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 31/12/2021<br>රු. | 31/12/2020<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 02 | 1,993,049,723 | 1,995,602,712 |
| **අඩු කළා :** භාවිතයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය | 03 | (1,773,858,294) | (1,467,445,467) |
| : විකුණුම් පිරිවැය | 04 | (2,752,848) | (357,336,048) |
| **Gross Profit** | | **216,438,581** | **170,821,197** |
| වෙනත් ආදායම් | 05 | 37,655,164 | 39,124,771 |
| **අඩු කළා : වියදම්** | | | |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 06 | 13,975,016 | 10,131,867 |
| පරිපාලන වියදම් | 07 | 106,755,873 | 92,126,861 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 08 | 4,214,731 | 6,961,464 |
| | | **124,945,620** | **109,220,191** |
| **බදු පූර්ව ශුද්ධ ලාභය** | | **129,148,125** | **100,725,776** |
| වර්ෂය සඳහා ආදායම් බද්ද - 2021 | 09 | (23,627,820) | (13,497,065) |
| **බදු පසු ශුද්ධ ලාභය** | | **105,520,305** | **87,228,711** |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 27 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්**
**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සටහන | 31/12/2021 | 31/12/2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 13 | 1,162,746,585 | 1,151,901,940 |
| විලම්බිත බදු වත්කම් | | 10,152,946 | 333,079 |
| **ජංගම වත්කම්** | | | |
| වට්ටෝරු භාණ්ඩ | 14 | 311,345,310 | 205,757,637 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත | 15 | 117,867,716 | 138,384,633 |
| මුදල් හා මුදල් සමාන දෑ | 16 | 653,805,894 | 448,334,873 |
| | | **1,083,018,919** | **792,477,143** |
| **මුළු වත්කම්** | | **2,255,918,451** | **1,944,712,162** |
| **කොටස් හිමිකම් හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 17 | 304,600,000 | 304,600,000 |
| විලම්බිත වගකීම් | 18 | 407,750,516 | 199,356,451 |
| ප්‍රත්‍යාගණන සංචිත | 19 | 511,096,168 | 462,899,383 |
| වියදම ඉක්මවූ සමුච්චිත ආදායම | | 656,621,192 | 731,769,717 |
| **මුළු කොටස් හිමිකම්** | | **1,880,067,876** | **1,698,625,552** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 20 | 78,690,831 | 75,103,012 |
| වෛද්‍යාධාර අරමුදල | 21 | 433,945 | 318,623 |
| කාල නිර්ණ ණයවර ලිපි ණය | 22 | | 23,437,500 |
| | | **79,124,775** | **98,859,135** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත | 23 | 296,725,799 | 147,227,475 |
| **මුළු කොටස් හිමිකම් හා බැරකම්** | | **2,255,918,451** | **1,944,712,162** |

ඉහත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉතා වැදගත් අංගයක් සුසාදනය කරන පිටු අංක 6 සිට 27 දක්වා ගෙන හැර ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට කරන ලද සටහන් හා සමග සංයෝජිතව කියවිය යුතු වන්නේ ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

..................................
**මූල්‍ය ප්‍රධානී**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ..

මණ්ඩලය වෙනුවෙන් සහ ඒ උදෙසා අනුමත කර අත්සන් කරන ලදී.

.................................. ..................................
**සභාපති** **අධ්‍යක්ෂ**

ජා ඇල, කපුවත්ත.
දිනය : 24/02/2022

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
### කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | වියදම ඉක්මවූ සමුච්චිත ආදායම | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| 2020.01.01 දිනට ශේෂය | | 304,600,000 | 250,562,776 | 131,176,703 | 600,524,515 | 1,286,863,993 |
| එකතු කිරීම් / අඩු කිරීම් - 2020 | | | 5,775,733 | 331,722,680 | | 337,498,413 |
| ක්ෂය වීම් - සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් | | | (56,982,057) | | | (56,982,057) |
| පූර්ව ගැළපුම් | | | | | 44,016,492 | 44,016,492 |
| වියදම ඉක්මවූ ආදායම - 2020 | | | | | 87,228,711 | 87,228,711 |
| 2020.12.31 දිනට ශේෂය | | **304,600,000** | **199,356,451** | **462,899,383** | **731,769,717** | **1,698,625,552** |
| 2021.01.01 දිනට ශේෂය | | 304,600,000 | 199,356,451 | 462,899,383 | 731,769,717 | 1,698,625,552 |
| එකතු කිරීම් / අඩු කිරීම් - 2021 | | | 208,394,065 | 48,196,785 | | 256,590,850 |
| පූර්ව ගැළපුම් | **24** | | | | (180,668,831) | (180,668,831) |
| බදු පසු ශුද්ධ ලාභය - 2021 | | | | | 105,520,305 | 105,520,305 |
| 2021.12.31 දිනට ශේෂය | | **304,600,000** | **407,750,516** | **511,096,168** | **656,621,192** | **1,880,067,876** |

**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 31/12/2021<br>රු. | 31/12/2020<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| වියදම ඉක්මවූ බදු පෙර ආදායම | 129,148,125 | 100,725,776 |
| **ගැළපුම්** | | |
| ක්ෂය වීම් | 63,622,209 | 61,575,852 |
| පොලී ආදායම | (15,605,267) | (22,575,619) |
| වර්ෂය සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන | 6,628,794 | 26,568,298 |
| වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන | 226,800 | 221,760 |
| පූර්ව වර්ෂ ගැළපුම් | (172,326,311) | 44,016,492 |
| | **(117,453,776)** | **109,806,783** |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය | **11,694,349** | **210,532,559** |
| **කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්** | | |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම) | 20,516,917 | 48,602,109 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම) | 124,010,657 | (107,871,339) |
| වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම) | (105,587,673) | (26,896,880) |
| | **38,939,902** | **(86,166,110)** |
| මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත මුදල් | **50,634,251** | **124,366,449** |
| **අඩු කළා :** ගෙවන ලද පාරිතෝෂික | (3,040,975) | (4,775,090) |
| වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම් | (111,478) | (149,974) |
| මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | **47,481,798** | **119,441,386** |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම | (26,270,069) | (210,045,343) |
| කෙටි කාලීන ආයෝජනයන්හි කළ ආයෝජන | (138,264) | (163,022) |
| කාල නිර්ණ ණයවර ලිපි ණය | (23,437,500) | 79,687,500 |
| ලද පොලී | 4,722,727 | 5,384,276 |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | **(45,123,105)** | **(125,136,589)** |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 192,091,525 | (51,206,324) |
| මුදල් සහ මුදල් සමාන දෑ හී ශුද්ධ වැඩිවීම | 194,450,217 | (56,901,527) |
| මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන එන ලදි | 146,039,413 | 202,940,940 |
| මුදල් හා මුදල් සමාන දෑ ඉදිරියට ගෙන යන ලදි | **340,489,630** | **146,039,413** |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් සමාන දෑ හී විශ්ලේෂණය** | | |
| ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංකය 71324617 | 226,499,810 | 101,983,383 |
| ලංකා බැංකුව, ජා-ඇල ගිණුම් අංකය 80306903 | 113,989,819 | 44,056,030 |
| | **340,489,630** | **146,039,413** |

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

### නිෂ්පාදන ගිණුම
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 31/12/2021<br>රු. | 31/12/2020<br>රු. |
|---|---|---|---|
| **නිෂ්පාදන පිරිවැය** | | | |
| **අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය** | | | |
| 2021.01.01 දිනට ශේෂය | | 143,338,765 | 117,286,466 |
| 2021.01.1 දිනට සුපෝෂ ශේෂය | | 16,246,547 | - |
| මිලදී ගැනීම් | 10 | 1,521,135,242 | 1,126,423,719 |
| | | 1,680,720,554 | 1,243,710,185 |
| වට්ටෝරු භාණ්ඩ හායනය | | (44,604) | - |
| 2021.12.31 දිනට ශේෂය | 14 | (172,340,457) | (143,338,765) |
| පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය | | **1,508,335,493** | **1,100,371,420** |
| | | | |
| සෘජු ශ්‍රම හා කළමනාකරණ පිරිවැය | 11 | 204,362,319 | 225,256,009 |
| කම්හල් පොදුකාර්ය වියදම් | 12 | 121,615,903 | 140,813,279 |
| | | **1,834,313,715** | **1,466,440,708** |
| | | | |
| **කෙරෙමින් පවත්නා වැඩ** | | | |
| 2021.01.01 දිනට ශේෂය | | 1,187,639 | 2,192,398 |
| 2021.12.31 දිනට ශේෂය | 14 | (15,072,093) | (1,187,639) |
| | | (13,884,454) | 1,004,759 |
| | | | |
| **මුළු නිෂ්පාදන පිරිවැය** | | **1,820,429,261** | **1,467,445,467** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන්
2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1.1 වාර්තා කිරීමේ ආයතනය**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි.

2020 වසරේ දී, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, එහි රේඛීය අමාත්‍යාංශය ලෙස කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අනුයුක්ත කෙරිණි. (2020.08.09 දිනැති 2187/ 27 අති විශේෂ ගැසට් පත්‍රය)

සමාගමේ ලියා පදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 යන ලිපිනයෙහි පිහිටා ඇත.

**1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන" සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කර අලෙවි කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

**1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය**

1. දීප්ති කුලරත්න මහතා (සභාපති)
2. වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා
3. ආචාර්ය ලක්මිණි එන්. මාගොඩරත්න මහත්මිය
4. එච්. එම්. තේජා හේරත් මහත්මිය
5. ප්‍රනීත් මහල්ල මහතා
6. ආචාර්ය චිත්‍රමාලි ද සිල්වා මහත්මිය
7. ආර්. එම්. පී. එස්. අබේරත්න මහතා

**නිරීක්ෂකවරුන්**

1. ඩී. සී. වික්‍රමසේන මහත්මිය
2. ඒ. පී. කොඩිකාර මහත්මිය

**මණ්ඩලයේ ලේකම්**

තනුජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

**1.1.4 විගණක**

ජාතික විගණන කාර්යාලය
අංක 306 / 72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

**1.1.5 බැංකුකරුවන්**

ලංකා බැංකුව,
ජා ඇල.

**1.1.6 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය**

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2021 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

**1.1.7 පිළියෙළ කිරීමේ පදනම**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කරනු ලැබ ඇත. සාධාරණ අගය මත ගැනෙන වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඒවා යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය සිය විනිශ්චයමතිය ක්‍රියාවට නැංවීමේ ද අවශ්‍ය වන්නේ ය. ඉහළ මට්ටමේ විනිශ්චයමතියක් අදාළ වන හෝ සංකීර්ණතාවයක් ඇතිවන ක්ෂේත්‍ර හෝ සමාගමේ මූල්‍ය ප්‍රකාශ සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කරනු ලැබ ඇත.

**අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පදනම් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි වරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ය.

**ආ. නිර්ණය කිරීමේ පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හි දී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

**ඇ. සංසන්දනාත්මක තොරතුරු**

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවක දී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

**ඈ. කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල**

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

**ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පූර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමනවලින් වෙනස් විය හැකි ය.

ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

**ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය**

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

**1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්**

**1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ**

**a. හඳුනා ගැනීම සහ මානනය කිරීම**

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ යක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස ගණනය කළ හැකි නම් පමණි.

ඇ. ප්‍රත්‍යාගණනය කිරීම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය සතු සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදි. (එම තක්සේරු වාර්තාව 2020 දී ලැබුණු අතර ඒ අනුව සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයට 2020 වර්ෂයේ දී ලක් කරන ලදී)

ඈ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ සරල මාර්ග පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 ට වැඩි |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | අවුරුදු 10 ට වැඩි |
| මෝටර් රථ වාහන | අවුරුදු 05 ට වැඩි |
| උපකරණ හා මෙවලම් | අවුරුදු 05 ට වැඩි |
| විද්‍යාගාර උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| කෘෂිකාර්මික උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| විදුලි වැඩ | අවුරුදු 05 ට වැඩි |
| කාර්යාල උපකරණ | අවුරුදු 10 ට වැඩි |
| ලී බඩු සහ සවි කිරීම් | අවුරුදු 10 ට වැඩි |
| පරිගණක උපකරණ | අවුරුදු 04 ට වැඩි |
| අස්පෘශ්‍ය වත්කම් | අවුරුදු 04 ට වැඩි |

නියුට්‍රිබාර් යන්ත්‍රෝපකරණ ස්ථාපන කටයුතු ක්‍රියාවලිය 2022 දී අවසන් කිරීමට නියමිත හෙයින් එහි පිරිවැය ක්ෂය කිරීමේ කටයුතු සම්පූර්ණ නොකෙරුණි.

ඉ. හඳුනා නොගැනීම

බැහැර කරන විට දී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවක දී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

### 1.2.2 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේ දී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ දී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේ දී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේ දී ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

### 1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම වෙත ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

### 1.2.4 වට්ටෝරු භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ වට්ටෝරු භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම (FIFO) මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

වට්ටෝරු භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේ දී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ :

අමු ද්‍රව්‍ය - ගත් මිලට

කෙරෙමින් පවතින වැඩ - ගත් මිලට

නිම කළ භාණ්ඩ - සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව

ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.

ලබා ගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

### 1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ධාරක ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

### 1.2.6 මූල්‍ය වත්කම්

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායි සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙනු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවක දී ය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනා ගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේ දී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතින් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීමක් කෙරෙන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

**අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළ දී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම් ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් නම් කර වර්ගීකරණය කර නොමැත.

## ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, හායන අඩු කර ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කර ගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලී අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

## ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

රජයේ සුරැකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

## ඈ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ නම් කර වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉදිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරැකුම් මත පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස නම් කර වර්ගීකරණය කරනු ලැබ නොමැත.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 - මූල්‍ය උපකරණ

මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ආදේශ වේ: වර්ගීකරණය සහ මානනය කිරීම, දුබලත්වයට පත්වීම වීම සහ ප්‍රාවීකරණ (හෙජ්) ගිණුම්කරණය යන මූල්‍ය මෙවලම් සඳහා වූ අංශත්‍රයම එකට ගෙන එමින් 2018 ජනවාරි මස 1 වන දිනයට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා හඳුනා ගැනීම සහ මානනය කිරීම.

සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 සම්මත කර ගත්තේ සම්පූර්ණ අතීතානුසාරී ක්‍රමය භාවිතා කරමිනි. සිදු කරන ලද තක්සේරුව මත පදනම්ව, සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 විශාල බලපෑමක් ඇති නොකරන බව සමාගම නිගමනය කර ඇත.

**වර්ගීකරණය සහ මානනය කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, වෙළඳ ලැබිය යුතු මුදල් හැර, සමාගම ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එහි සාධාරණ අගයට ය. ඊට අමතරව මානනයක් සිදු කෙරෙනුයේ, ලාභ හෝ අලාභ සහ ගනුදෙනු පිරිවැය හරහා සාධාරණ අගය මත ගණනය නොවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, ණය මූල්‍ය මෙවලම්, ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයක් මතත්, ක්‍රමක්ෂය කළ පිරිවැය හෝ වෙනත් විස්තීරණ ආදායම හරහා වූ සාධාරණ අගයක් මතත් පසු අවස්ථාවක දී මනිනු ලැබේ. මෙම වර්ගීකරණය, නිර්ණායක දෙකක් මත පදනම් වේ. එනම්, වත්කම් කළමනාකරණය සඳහා වූ සමාගමේ ව්‍යාපාර ආකෘතිය මත: සහ මෙවලම්වල කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන්, පරිශේෂව ඇති ''මුල් මුදල මත මුල් මුදල හා පොලී මුදල පමණක් වූ ගෙවීම්'' නියෝජනය කරන්නේ ද යන්න මත.

2018 ජනවාරි මස 1 වන දින මූලික අයදුම් කිරීමේ දිනය වන විට ආයතනයේ ව්‍යාපාර ආකෘති තක්සේරුව සිදු කරන ලද අතර, පසුව, එය, 2018 ජනවාරි මස 1 වන දිනට පෙර හඳුනා නොගත් මූල්‍ය වත්කම් සඳහා අතීතයට ද බලපාන පරිදි යොදන ලදී. ණය මෙවලම් මත කොන්ත්‍රාත් ගත මුදල් ප්‍රවාහයන්හි තක්සේරු කිරීම, හුදෙක් මූලික මුදල හා පොලී මුදල්වලින් පමණක් සමන්විත වන්නේ ද යන්න පදනම් වූයේ, වත්කම්වල ආරම්භක හඳුනා ගැනීමේ දී ඇති කරුණු සහ තත්වයන් මත ය.

සමාගමේ මූල්‍ය වගකීම් සඳහා වූ ගිණුම්කරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පැවති ආකාරයටම බොහෝ දුරට පවතී.

### 1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට හරයාත්මක සාක්ෂි පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් සිදු වී ඇත්නම්, එම දුබල වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 සම්මත කිරීම මගින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 තුළ පැවති සිදු වූ අලාභ ආශ්‍රිත ප්‍රවේශය වෙනුවට ඉදිරි දැක්මක් සහිත අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් ප්‍රතිස්ථාපනය වීමෙන් මූල්‍ය වත්කම් සඳහා වූ දුබලතා අලාභ පිළිබඳ සමාගමේ ගිණුම්කරණය මූලික වශයෙන් වෙනස් කරනු ලැබ ඇත.

සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් වෙනුවෙන් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත පවත්වා නොගැනෙන අපේක්ෂිත ණය අලාභ සඳහා යම් ඉඩ හැරීමක් සටහන් කර තැබීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 නියම කරයි.

අපේක්ෂිත ණය අලාභ පදනම් වනුයේ, කොන්ත්‍රාත්තුවට අනුව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ආයතනය වෙත ලැබෙතැයි අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත ය. කිසියම් අඩුවක් ඇත්නම්, එය, වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට ආසන්න වන පරිදි පසුව වට්ටම් කරනු ලැබේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රමිතයේ සරල ප්‍රවේශය ආයතනය විසින් යොදා ගගනු ලැබිය යුතු අතර අපේක්ෂිත ණය අලාභ, ඒවායේ ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ගණනය කළ යුතු වන්නේ ය.

### 1.2.8 මුදල් හා මුදල් සාමයයන්

අතැති මුදල්, බැංකු තැන්පතු, ස්ථාවර තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාමයයන් සමන්විත වේ.

### 1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේ දී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

#### 1.3.1 සේවක ප්‍රතිලාභ

#### අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ 19 යන සේවක ප්‍රතිලාභල ප්‍රමිතය සමාගම විසින් අනුගමනය කරනු ලැබ ඇති අතර සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කර ඇත.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | **08%** |
| ඉදිරි වැටුප් වැඩිවීම් අනුපාතය | **10%** |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | **02%** |
| විශ්‍රාම ගැනීමේ වයස | අවුරුදු **62** |

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

#### ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හි දී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

#### ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 15% හා 10% බැගින් වන පරිදි, 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ඉදිරියට සිය දායකත්වය අනුමත කරන ලද අර්ථසාධක අරමුදල වෙත සලසා දෙනු ලැබේ. (පෙර පැවති අනුපාත - සමාගම සහ සේවකයින්, පිළිවෙළින් 12% සහ 8% කින් දායක විය.)

#### ඈ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

### 1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

### 1.3.3 බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018.04.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබ ඇත. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරනු ලැබ ඇති ආදායම් හා වියදම් මූලාංගයන් මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට හා ඊට ඉන් පසුව සිදු කෙරෙන සංශෝධන අනුව ආදායම් බදු ආගණනය කෙරේ.

එකතු කළ අගය මත බද්ද (ඩ්ඔ), 2002 අංක 14 පනත මගින් හඳුන්වා දී ඇති අතර එය, 2002 අගෝස්තු මස 1 වන දින සිට බලාත්මක වේ. වැට් බදු පනතට අනුව, අපනයන විකුණුම් මත වැට් බදු ගෙවීමට සමාගම බැඳී සිටින අතර එය, 2021 වර්ෂයේ දී වාර්තා කරන ලදී.

### 1.3.4 විලම්බිත බදුකරණය

විලම්බිත බද්ද සම්පාදනය කරනු ලබන්නේ, වත්කම් සහ වගකීම්වලට අයත් බදු පදනම්හි සහ අදාළ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වාර්තා කරන දිනයේ දී එකී වත්කම් සහ වගකීම්වල පවත්නා ඉදිරියට රැගෙන යන අගය අතර තාවකාලික වෙනස්කම් මත පිහිටා වගකීම් ක්‍රමවේදය භාවිතා කරමිනි.

### 1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

## 1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

**ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)**

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

### 1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යාකොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතික වීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේ ම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 1.4.2 වියදම්

**අ.** දරන ලද පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල දී සහ කාර්යක්ෂම අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

### 1.4.3 මූල්‍ය වියදම් / ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

## 1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 07 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

## 1.6 වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්න වූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

## 1.7 නව ගිණුම්කරණ ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථකථන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 2018 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන නව ප්‍රමිතීන් අනුගමනය කිරීමට හැර, පෙර මූල්‍ය වර්ෂය තුළ සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. දැනටමත් නිකුත් කරනු ලැබ ඇති නමුත් මේ දක්වා බලාත්මක නොවන වෙනත් යම් ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් සමාගම විසින් සම්මත කර ගනු ලැබ නොමැත.

(i) "මූල්‍ය මෙවලම් : හඳුනා ගැනීම සහ මානනය කිරීම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 39 දරන ප්‍රමිතියෙහි බහු වර්ගීකරණ සහ මිනුම් ආකෘතීන් වෙනුවට මූලින් වර්ගීකරණ කාණ්ඩ දෙකක් පමණක්, එනම්, ක්‍රමක්ෂගත පිරිවැය සහ සාධාරණ අගය යනුවෙන් පැවති තනි මාදිලියක් සහිත ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 9 යන "මූල්‍ය මෙවලම්" ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය වේ.

(ii) භාණ්ඩ හා සේවා සඳහා වන කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 18 සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 11 වෙනුවට "ගනුදෙනුකාර භවතුන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 15 දරන ප්‍රමිතිය ආදේශ වන්නේ ය. නව ප්‍රමිතිය පදනම් වී ඇත්තේ, භාණ්ඩයක හෝ සේවාවක පාලනය ගනුදෙනුකරුවකු වෙත පවරනු ලබන විට ආදායම හඳුනා ගැනීම යන මූලධර්මය මත ය. එබැවින් පාලනය පිළිබඳ සංකල්පය දැනට පවතින අවදානම් සහ ත්‍යාග පිළිබඳ සංකල්පය ප්‍රතිස්ථාපනය කරයි.

(iii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 1, එනම්, 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රථම වරට අනුගමනය කිරීම', ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 7, එනම්, 'මූල්‍ය මෙවලම් හෙළිදරව් කිරීම්' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 19, එනම්, 'සේවක ප්‍රතිලාභ' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 10, එනම්, 'ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ' සඳහා සිදු කරන ලද තව දුරටත් අදාළ නොවන සංශෝධන මගින් සංක්‍රාන්ති විධිවිධාන ආවරණය කරමින් අදාළ කෙටි කාලීන නිදහස් කිරීම් ඒ හරහා කපා හරියි.

(iv) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 එනම්, "කල් බදු", මූලික වශයෙන් බදුලාභීන් විසින් සිදු කරනු ලබන ගිණුම්කරණයට බලපානු ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත කල්බදුකර සියල්ලම පාහේ හඳුනා ගැනීමට එය හේතු වනු ඇත. ප්‍රමිතිය මගින් මෙහෙයුම් සහ මූල්‍ය කල්බදු අතර වත්මන් වෙනස ඉවත් කරන අතර වත්කමක් (කල් බදු දෙන ලද අයිතමය භාවිතා කිරීමේ අයිතිය) හඳුනා ගැනීමත්, අත්‍යන්ත වශයෙන් සියලුම කල්බදු කොන්ත්‍රාත්තු සඳහා කුලී ගෙවීම හා සම්බන්ධ මූල්‍ය වගකීමත් එමගින් අවශ්‍ය වේ. කෙටි කාලීන සහ අඩු වටිනාකමින් යුත් කල්බදු සඳහා විකල්ප නිදහස් කිරීම් පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන මූලධර්ම ගෙන හැර දක්වා ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 යටතේ, 'අඩු වටිනාකමක්' සහිත සහ මාස 12 හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත කෙටි කාලීන කල්බදු සඳහා වන නිදහස් කිරීම් කිපයක් හැර, මූල්‍ය කල්බදු සඳහා වූ ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා බදුලාභීන් විසින් ගිණුම්ගත කිරීම් සිදු කරනු ලැබීම අවශ්‍ය වන්නේ ය. මෙම ප්‍රමිතිය 2019 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(v) කොටස් ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය මෙවලම් මත ලාභාංශවලින් උද්ගත වන ආදායම් බදු ප්‍රතිවිපාක හඳුනා ගත යුත්තේ, බෙදා හැරිය හැකි ලාභ උත්පාදනය කළ අතීත ගනුදෙනු හෝ සිදුවීම් අනුව හඳුනා ගනු ලැබූ කල්හි බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 වන "ආදායම් බදු" ප්‍රමිතියෙහි සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතිය අළලා කළ වැඩි දියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vi) යම් අදාළ සුදුසුකම් ලැබීමේ වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා හෝ විකිණීම සඳහා සූදානම් වූ පසු කිසියම් නිශ්චිත ණය ගැනීමක් නොගෙවා ශේෂව පවතී නම්, එය සාමාන්‍ය ණය ගැනීම්වල කොටසක් බවට පත් වන බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 වන "ණය ගැනීමේ පිරිවැය" අළලා කරන ලද සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දිනට හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 3, එනම්, "ව්‍යාපාර සංයෝජිතය" යන්නට කළ සංශෝධන මගින් පැහැදිලි කර ඇත්තේ, ඒකාබද්ධ මෙහෙයුමක් වන ව්‍යාපාරයක පාලනය ලබා ගැනීම අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාරික සංයෝජනයක් බවයි. ප්‍රමිතියේ වැඩි දියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

### 1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට ප්‍රථම වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව යමින් මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත හායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත හායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

### 1.9 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත විශ්ලේෂණය

**ඉලක්ක 2 : ශුන්‍ය කුසගින්න :**

කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව අත් කර ගැනීම සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

**2.1 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**

2030 වන විට, කුසගින්න නිමා කර, සියලුම මිනිසුන්ට, විශේෂයෙන්, දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින පුද්ගලයින්ට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික වීම.

**2.1.1 දර්ශකය :**

මන්දපෝෂණය පැතිරීම.

**2.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**

2025 වන විට, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ වර්ධනය බාලවීම සහ මන්දනය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් එකඟ වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇතුළුව 2030 වන විට, සියලුම ආකාරයේ මන්දපෝෂණය අවසන් කිරීම සහ නව යොවුන් වියේ ගැහැණු ළමයින්, ගර්භනී සහ කිරි දෙන කාන්තාවන් සහ වැඩිහිටි පුද්ගලයින් යන අයවළුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම.

**2.2.1 දර්ශකය :**
වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර වර්ගය අනුව (මන්දනය සහ අධික බර) මන්දපෝෂණය (උස අනුව බර >+2 හෝ <-2 සම්මත අපගමනය - ලෝක සෞඛ්‍යය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතිවල මධ්‍යස්ථය අනුව) පැතිර පැවතීම.

**2.3 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**
ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපළ සහ අගය එකතු කිරීම සහ ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථා යනාදී දෑ හරහා ඒවා වෙත සුරක්ෂිතව හා සමාන ප්‍රවේශයක් ලබා දීම ඇතුළුව 2030 වන විට, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්, ආදි වාසීන්, පවුල් ගොවීන්, එඬේරුන් සහ ධීවරයින් අයගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම දෙගුණ කිරීම.

**2.3.1 දර්ශකය :**
ලිංගිකත්වය සහ ස්වදේශික තත්ත්වය අනුව, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම.

**ඉලක්ක 9 : කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් :**
ඔරොත්තු දී පවතින යටිතල පහසුකම් ගොඩනැගීම, අන්තර්ගතභාවය සහ තිරසර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

**9.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**
ඇතුළාන්තිය හා තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ 2030 වන විට, ජාතික තත්වයන්ට අනුකූලව, කර්මාන්තයේ රැකියා කොටස සහ දළ දේශිය නිෂ්පාදිතය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ඌණ සංවර්ධිත රටවල එහි කොටස දෙගුණ කිරීම.

**9.2.1 දර්ශකය :**
- දළ ජාතික නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම. .
- සමස්ත සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස රැකියා නිෂ්පාදනය.

**9.4 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**
2030 වන විට, සියලු රටවල් තම හැකියාවන්ට අනුකූලව ක්‍රියා කරමින් යටිතල පහසුකම් සහ ප්‍රතිනිර්මිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, සම්පත් පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිසිදු හා පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලින් වැඩි වශයෙන් භාවිතා කිරීම.

**9.4.1 දර්ශකය :**
අගය එකතු කරන ලද ඒකකයකට කාබන් ඩයොක්සයිඩ් - CO2 ජ විමෝචනය

**9.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**

2030 වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන සේවකයින් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, 2030 වන විට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම.

**9.5.1 දර්ශකය :**
- දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස පර්යේෂණ සහ සංවර්ධන වියදම් වැඩි දියුණු කිරීම.
- ජනගහනය මිලියනයකට පර්යේෂකයන් (පූර්ණ කාලීනව සමාන)

**ඉලක්ක 12 : වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය :**

තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

**12.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**
2030 වන විට, වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය උත්පාදනය සැලකිය යුතු ලෙස අඩු කිරීම.

**12.5.1 දර්ශකය :**

ජාතික ප්‍රතිචක්‍රීකරණය අනුපාතය, ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ටොන් ගණන.

**12.7 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**
ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

**12.7.1 දර්ශකය :**

තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරන රටවල් ගණනාවක්.

**12 අ. අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය :**

සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් කරා ගමන් කිරීම සඳහා ඔවුන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය වීම.

**12 අ. 1 දර්ශකය :**

තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය සහ පාරිසරික වශයෙන් යහපත් තාක්ෂණයන් සඳහා පර්යේෂණ සහ සංවර්ධනය උදෙසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබෙන ආධාර ප්‍රමාණය.

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
## මූල්‍ය ප්‍රකාශවලට සටහන්
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 31/12/2021<br>රු. | 31/12/2020<br>රු. |
|---|---|---|
| **2 ආදායම** | | |
| සුපෝෂ විකුණුම් | 1,229,231,595 | - |
| අයහාරය | - | 1,447,012,628 |
| ක්ෂය වීම | - | 56,982,057 |
| සුපෝෂ විකුණුම් | 758,167,173 | 481,012,992 |
| හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම් | 4,215,630 | 6,817,300 |
| ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන විකුණුම් | 203,680 | 207,590 |
| කජු විකුණුම් ආදායම | - | 281,740 |
| එස් ඩී කේ නිෂ්පාදන විකුණුම් | 337,055 | 857,805 |
| බේකරි නිෂ්පාදන | 894,590 | 2,430,600 |
| | **1,993,049,723** | **1,995,602,712** |

**<u>සටහන : ත්‍රිපෝෂ විකුණුම්</u>**

රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ මුලපිරීම මත, 2021.01.1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉන්වොයිස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

| | 31/12/2021 | 31/12/2020 |
|---|---|---|
| **3 පරිභෝජනයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය** | | |
| 2021.01.01 දිනට නිමවූ නිෂ්පාදන | - | - |
| මුළු නිෂ්පාදන පිරිවැය | 1,820,429,261 | 1,467,445,467 |
| 2021.12.31 දිනට නිමවූ නිෂ්පාදන | (46,570,967) | - |
| | **1,773,858,294** | **1,467,445,467** |
| **4 විකුණුම් පිරිවැය** | | |
| 2021.01.01 දිනට ශේෂය | 17,342,122 | 17,715,889 |
| ලැබුණා - සුපෝෂ | - | 349,122,185 |
| ගැනුම් - හයිලන්ඩ් නිෂ්පාදන | 3,204,191 | 5,655,458 |
| ගැනුම් - ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන | - | 187,106 |
| ගැනුම් - එස් ඩී කේ නිෂ්පාදන | 86,567 | 622,576 |
| ගැනුම් - බේකරි හා වෙනත් | 402,750 | 1,097,559 |
| ගැනුම් - කජු | - | 277,398 |
| | **21,035,630** | **374,678,170** |
| 2021.12.31 දිනට ශේෂය | (18,282,782) | (17,342,122) |
| | **2,752,848** | **357,336,048** |
| **05 වෙනත් ආදායම්** | | |
| අපතය විකුණුම් | 17,674,835 | 12,614,477 |
| නිවාස ණය පොලී | 1,247,526 | 1,675,983 |
| පොලී ආදායම | 177,595 | 42,600 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 4,672,727 | 5,384,276 |
| ස්ථාවර තැන්පතු මත පොලී | 10,932,540 | 17,191,343 |
| වෙනත් | 2,949,940 | 2,216,092 |
| | **37,655,164** | **39,124,771** |

| | 31/12/2021<br>රු. | 31/12/2020<br>රු. |
|---|---|---|
| **06 විකුණුම් හා බෙදාහැරීමේ වියදම්** | | |
| ප්‍රවාහන වියදම් | 662,712 | 2,974,774 |
| බෙදාහැරීම | 4,508,845 | - |
| වාහන අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු | 1,254,197 | - |
| අලෙවි සැල් වියදම් | 368,485 | 855,214 |
| මුද්‍රණ හා ප්‍රචාරණ | 3,106,377 | 2,215,210 |
| විකුණුම් කොමිස් හා වෙනත් වියදම් | - | 12,269 |
| ක්ෂය වීම | 4,074,400 | 4,074,400 |
| | **13,975,016** | **10,131,867** |

| | | |
|---|---|---|
| **7 පරිපාලන වියදම්** | | |
| වැටුප් | 12,110,153 | 12,213,553 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,303,513 | 2,396,334 |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | 460,703 | 479,267 |
| අතිකාල දීමනා | 4,444,874 | 3,877,490 |
| දීමනා | 3,722,095 | 3,595,382 |
| අනියම් වේතන | 368,000 | - |
| අනියම් වේතන මත සේ.අ.අ. | 90,000 | - |
